# මහනුවර චිත්‍ර ශෛලීය යුගයේ භාවිතා වූ චිත්‍ර කලා තාක්ෂණ වේදයන් සහ දේශීය වෛද්‍ය විද්‍යා සංකල්පය අතර ඇති සමානාත්මතා


## එච්.එම්. සේනාධීර[1]



ශ්‍රී ලාංකික සිතුවම් කලා විෂය විවිධ අංශවලින් විමසා බැලිය හැකි විෂය ධාරාවකි. ඉතිහාසමය, සාහිත්‍යමය, වාර්තාමය, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, තාක්ෂණික, සංරක්ෂිතාත්මක, පුනනස්ථාපන ආදී ක්ෂේත්‍රයන්ට බාහිරව දේශීය වෛද්‍ය විද්‍යා දෘෂ්ටිකෝණයකින් ද ඒ පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් කිරීම මෙහි පරමාර්ථයයි. චිත්‍ර නිර්මාණය සඳහා ශාක කොටස් උපයෝගී කර ගනිමින් වර්ණක හා බදාම සංයෝග ණිපදවීම බොහෝ දුරට දේශීය වෛද්‍ය ක්‍රමයේ එක් කසාය ක්‍රමයකට සමාන ලක්ෂණ පෙන්වන්නක් විය. ඒ අනුව "ශ්‍රී ලාංකික චිත්‍ර කලා ශිල්පීය ඥානය හා බද්ධ වූ ආයුර්වේදීය මූලධර්ම ඥානයක් ද දැකිය හැකිය" යන උපකල්පනයක පිහිටියෙමු.

වර්ණක සකස් කර ගැනීම සඳහා භාවිතයට ගත් ශාක, ඛණිජ හා ශාක ද්‍රව්‍යවල ආයුර්වේදීය ඖෂධීය හා රසායනික ගුණ පිළිබඳ වෛද්‍යමය සිද්ධාන්ත උපයෝගිත්වයෙන් වර්ණ භාවිතයේ දී වෛද්‍ය චිකිත්සාමය සිද්ධාන්ත භාවිතය, වර්ණ හා ආලේප ආදිය සකස්කර ගැනීමේ දී ආයුර්වේදී භෛෂජ්ජ කල්පනා (කිරුම්, මිනුම් හා නිෂ්පාදන) මූලධර්ම යොදා ගැනීම හා චිත්‍රකලාකෘතියකින් පිළිබිඹු වන අර්ථය හෝ දාර්ශනික සංකල්ප හා බැදී ඇති වෛද්‍යමය දර්ශනය කෙරෙහි මෙහිලා අවධානය යොමු කෙරේ. මේ සඳහා 15-19 සියවස්හි චිත්‍ර නිර්මාණ උපයෝගි කර ගැනෙනුයේ ඒ අවධිය නිර්මාණ නිදර්ශක බහුල යුගයක් සේ සැලකෙන බැවිනි.



**ප්‍රමුඛ පදඃ** මහනුවර චිත්‍ර ශෛලීය චිත්‍ර කලා තාක්ෂණ වේදයන් දේශීය වෛද්‍ය විද්‍යා සංකල්ප


**Title:** Similarities between the Art Techniques of Kandyan Painting Style and Native Medicinal Concepts


**Keywords:** Art, Indigenous Medicine, three humors, Materia medica, Pharmaceutics


---


[1] අංක 526, හින්නාරන්දෙණිය, ගම්පොළ